# ගිරවු රංචුවෙන් පුංචි අපිට පාඩමක්



විශ්මි හිමන්දි ඇලපාත
2-C
මහාමායා බාලිකා විද්‍යාලය

- ගිරවු රංචුවෙන් පුංචි අපිට පාඩමක්
- විශ්මි හිමන්දි ඇලපාත



# <u>පිදුම</u>

මා ආදරයෙන්

ඇති දැඩි කළ

මාගේ ආදරණීය දෙමාපියන්ට

පුදමි........



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .
එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.
2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01



එකමත් එක කාලයක ගිරවු රංචුවක් හිටියා. මේ ගිරවු රංචුව හරිම අමුතුයි. මේගොල්ලන්ගෙ හොට සුදු පාටයි. දවසක් මේ ගිරවු රංචුව ගමනක් ගියා. එතකොට රතු පාට තීන්ත භාජනයක් දැක්කා.



ඊට පස්සේ එක ගිරවෙක් එම භාජනයට හොට දාලා බැලුවා. එක ගිරවෙක් කිව්වා ඔයාගේ හොට රතු පාටයි ලස්සනයි කියලා.



ඊට පස්සේ ඔක්කෝම ගිරවු භාජනයට හොට දැම්මා. හැම ගිරවගේම හොට රතු පාට වුණා. මේ ගිරවු රංචුව වැස්ස එන්න කලින් තමන්ගේ කූඩුවට ගියා.



ඔන්න එක පාරටම වැස්ස ආවා. ගිරවු රංචුව හොට කූඩුවෙන් එලියට දාගෙන නිදාගත්තේ. වැස්සට ඒගොල්ලන්ගේ හොටේ තිබුන රතු පාට තීන්ත සේදිලා ගියා.



වැස්ස නැවතුනා ගිරවු රංචුව ඇහැරලා බලන කොට එයාලගේ හොට ආයෙමත් සුදු පාට වුණා. ගිරවු රංචුව දුක් වුණා. එයාලා නැවත තීන්ත භාජනය බලන්න ගියා ඒක එතන තිබුනේ නැහැ.



පියාඹා යන විට ගිරවු රංචුව චෙරි ගසක් දැක්කා. ඒ ගසේ ගෙඩි රතුම රතු පාටයි. ගිරවු රංචුව හිතුවා මේ චෙරි කෑවොත් අපේ හොට රතු වෙයි කියලා.



ඊට පස්සේ ගිරවු රංචුව ඒ ගසේ තිබුණු චෙරි කෑවා.ආයෙමත් ගිරවුන්ගේ හොට රතු පාට වුණා.



හොට රතු පාට නිසා එයාලා සතුටින් සිංදු කියමින් ආඩම්බරයෙන් හිටියා. මෙහෙම ඉන්නකොට එයාලට වතුර තිබහක් ආවා.



ගිරවු රංචුව වතුර බොන්න කැලේ තියෙන ගඟට ගියා වතුර බීලා ඉවරවෙනකොට ආයෙමත් එයාලගේ හොට සුදු පාට වුණා.



ගිරවු රංචුවට දුක හිතුණා. බොරු දේවල් හැමදාටම කරන්න බැරි බව තේරුම් ගත්තා. ගිරවු කැලේට පියඹා ගියා.



# ස්තූතියි

මෙම පොත සෑදීමට සහය දැක්වූ

මාගේ ආදරණීය දෙමාපියන්ටත්,

මාගේ පන්තිභාර ගුරුමෑණියන් වන

රේණුකා රාජපක්ෂ ගුරුමෑණියන්ටත්

නන් අයුරින් සහය දැක්වූ

සියළු දෙනාටත් තුති.....

# <u>පසු වදන</u>



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඍදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .


මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක


2023 . 11 . 01


9 786242 066059

ISBN 978-624-206-605-9